# FPA පුවත් සංග්‍රහය

## 2020 දී සැමට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන්

VISION2020 Sexual and reproductive health rights for all




කාන්තා හා ළමා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මැතිනිය ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ 'වසර 2020 දී සැමට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතීන්' වැඩසටහනට දායකත්වය ලබාදෙමින්...









අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ ප්‍රාදේශීය සභාවන් සංවිධානය කළ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වෛද්‍ය සායන ගරු චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමියගේ ප්‍රධානත්වයෙන් පැවති අවස්ථාවන්. වෛද්‍ය දිලීප් නිර්මාල් මහතා (පහළ වමේ) දේශනයක් පත්වමින්.

## ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ 48 වැනි විද්‍යාත්මක සැසියේදී...




ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ 48 වැනි විද්‍යාත්මක සම්මේලනය පසුගියදා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණි.

මෙම සම්මේලනයේ පවුල් සැලසුම් සහ පශ්චාත් ගබ්සා ප්‍රවේසම පිළිබඳ සැසිය සඳහා අනුග්‍රහය ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සමාජ අලෙවිකරණ වැඩසටහන මඟින් ලබාදෙන ලදී. අලෙවි ඒකකයේ ප්‍රාදේශීය කලමනාකරු උමයංග යාමරත්න මහතා විසින් පවුල් සංවිධාන සංගමය විසින් බෙදාහරින 'ජඩෙල්' සහ වෙනත් උපකරණ හඳුන්වා දෙමින්...

## සුබ සාධක සංගමය අවුරුදු පොළට එක්වෙමින්






ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සුබ සාධක සංගමය තරුණ බෞද්ධ කාන්තා සම්මේලනය සංවිධානය කළ අවුරුදු පොළ සඳහා එක්ව සිටි අයුරු



# FPA පුවත් සංග්‍රහය

2015 දෙවන කලාපය

www.fpasrilanka.org
තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...

**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org

## ක්‍රිකට් සමඟ HIV දැනුවත් කිරීම

තරුණ ප්‍රජාව තුළ HIV පිළිබඳ අවධානය යොමු කිරීමත් ඒ පිළිබඳ දැනුවත් කිරීමත් සඳහා සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගවලියක් සහ HIV දැනුවත් කිරීමේ වැඩසටහනක් අම්බලන්ගොඩදී පැවත් විය.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය, ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන සහ UNAIDS ආයතනයේ සම්බන්ධීකරණයෙන් සවිය සංවර්ධන පදනම සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රහය ගෝලීය අරමුදලේ දකුණු ආසියානු HIV ව්‍යාපෘතිය මඟිනි.

රජයේ ලිංගාශ්‍රිත රෝග වෛද්‍ය සායන මඟින් පැවත්වූ ස්වෙච්ඡා උපදේශන සහ HIV රුධිර පරීක්ෂා සායනය සඳහා රුධිර පරීක්ෂාවන් සිදුකර ගැනීමට ද තරුණ පිරිස් සහභාගී වූහ.









*ඉහළ ඡායාරූපය -*
*සහභාගී වූ තරුණ පිරිසක්, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ජ්‍යෙෂ්ඨ කලමනාකරු (මාධ්‍ය) ආනන්ද බෝධිනයක මහතා විසින් කළ HIV පිළිබඳ දැනුවත් කිරීමකට සවන් දෙමින්...*

*මැද ඡායාරූපය -*
*නීතිඥ අසෝක සෝමරත්න මහතා, සවිය පදනමේ ගරු සභාපති තුමිය, එහි වැඩසටහන් සහ පුහුණු අධ්‍යක්ෂ තුෂාර සේනානායක මහතා, බලපිටිය ලිංගාශ්‍රිත රෝග සායනයේ වෛද්‍ය ප්‍රසාද් ද සිල්වා මහතා, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ උමංගා සෙට්ටිනායක මෙනවිය, UNAIDS ආයතනයේ පුබුදු පතිරණ මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.*

*පහළ ඡායාරූපය -*
*ජයග්‍රාහී කණ්ඩායම 'සවිය' සංවිධානයේ පිරිස සමඟ*

## ගජබා සුපර්ක්‍රොස් 2015 සඳහා ස්ටැම්නා අනුග්‍රහය




අනුරාධපුර සාලියපුර හමුදා කඳවුර සංවිධානය කළ ගජබා සුපර්ක්‍රොස් 2015 සඳහා ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ස්ටැම්නා අනුග්‍රහය 4 වන වරටත් ලබාදෙන ලදී. MX රේසින් මෝටර් සයිකල් - 100 CC සිට 125 CC (2T) කාණ්ඩයේ තරග සඳහා මෙම අනුග්‍රහය හිමි විය. ජයග්‍රාහකයන්ට තිළිණ ප්‍රදානය කළ අවස්ථාව

*ඡායාරූපයේ වමේ සිට :*
*හර්ෂ පතිරණ මහතා (සහකාර අධ්‍යක්ෂ - අලෙවි) බුද්ධික සිල්වා - 2 වන ස්ථානය, සමීර ප්‍රේමරත්න - පළමු ස්ථානය, ඉන්දික බස්නායක - 3 වන ස්ථානය, අමිල ගුණසේකර මහතා (සහකාර අධ්‍යක්ෂ - සන්නාම ), අශෝක කපුරුගේ මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ - අලෙවි)*

VISION2020 Sexual and reproductive health rights for all

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය

# FPA පුවත් සංග්‍රහය

2015 දෙවන කලාපය

fpa SRI LANKA enriching relationships

www.fpasrilanka.org
තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...

VISION2020

# තිරසාර සංවර්ධන අභිමතාර්ථ ජයගැනීමේදී

## කාන්තාව - තරුණ සහ ළමා පරපුර ගැන වැඩි අවධානයක්

**- මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා**



"කාන්තාවන් සහ තරුණයින් සවිබල ගැන්වීම සංවර්ධනයේ ප්‍රතිඵලයක් විය යුතු ය. එසේම එමගින් ළමා ආරක්ෂණය ද තහවුරු විය යුතුය. තරුණයින්ගේ බලාපොරොත්තු කඩවීම බොහෝ විට ගැටුමකට මූලය සපයයි. එසේ වුවද තිරසාර සංවර්ධනයේ ගාමක බලවේගය වන්නේ ද තාරුණ්‍යයයි. එබැවින් තරුණ පරපුර 21 වැනි සියවසෙහි දැනුම්-පාදක ලෝකය ජය ගත හැකි නිපුණතා පූර්ණ ශ්‍රම බලකායක් බවට පරිවර්තනය කිරීම අපගේ ව්‍යායාමයේ ආරම්භක ලක්ෂය විය යුතුය. එය පශ්චාත් 2015 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංගයකි.

එලෙසම කාන්තාවන් සවි බල ගන්වන ජාතික වැඩ පිළිවෙළක් මගින් සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය.

එසේම ළමා පරපුරෙහි ආරක්ෂාව සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, කාර්යක්ෂම සහ මානුෂීය සමාජයක් ගොඩනැගීමේ අත්‍යවශ්‍ය සාධකයකි.

තිරසර සංවර්ධනය යනුවෙන් මා හඳුනාගන්නේ මානව සමාජයේ සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍රයන් එකිනෙකින් වෙන් වූ ක්ෂේත්‍ර හෝ කණ්ඩායම් වශයෙන් ගෙන දියුණු කිරීම නොවේ. ඒ වෙනුවට, සමස්ත මානව සමාජයම අපේක්ෂිත සංවර්ධන ඉලක්ක වෙත එක විට සහ එක ලෙස ඔසවා තැබිය හැකි සර්වග්‍රාහී සංවර්ධන ආදර්ශයකි. ඒ සඳහා නව විශ්වීය සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාව මම අවධාරණය කරමි."

ගරු මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමන් එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය අමතා සිදු කළ කථාවෙන් උපුටා ගන්නා ලදී.

## වාර්ෂික වාර්තාවට ජාත්‍යන්තර සම්මාන




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනී වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය (වමේ) සම්මාන ලබා ගත් මොහොත

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ 2014 වාර්ෂික වාර්තාව සඳහා 29 වැනි ජාත්‍යන්තර ARC සම්මාන ප්‍රදානයේදී රන් සම්මානයක් සහ තවත් සම්මාන දෙකක් හිමිව තිබේ. ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර පසුගියදා පැවැති සම්මාන ප්‍රදානයේදී ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය විසින් මෙම සම්මාන ලබා ගන්නා ලදී.

රන් සම්මානය රචනය සඳහාත්, ලෝකඩ සම්මානය සභාපතිතුමියගේ පණිවුඩය සඳහාත් ගෞරව සම්මානය සාම්ප්‍රදායික නොවන වාර්ෂික වාර්තා වෙනුවෙනුත් හිමි විය. වාර්ෂික වාර්තා වෙනුවෙන් පැවැත්වෙන විශාලතම ජාත්‍යන්තර තරගාවලිය වන මේ සඳහා රටවල් 35 ක අයදුම්පත් 2000 ක් පමණ ඉදිරිපත් වී ඇත.

# FPA සේවා මධ්‍යස්ථාන 7ක ස්වෙච්ඡා සේවක සේවිකාවන් සහ කාර්ය මණ්ඩල සේවා ඇගයීම.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අම්පාර, මඩකලපුව, මරදාන, කොග්ගල, මාතර, නුවරඑළිය සහ කිලිනොච්චිය මධ්‍යස්ථාන වල ස්වෙච්ඡා සෞඛ්‍ය සේවක සේවිකාවන් 50 දෙනෙකු සහ සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ 25 දෙනෙකු වෙත දුෂ්කර ප්‍රදේශයන්හි ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සඳහා ක්‍රියාත්මක වූ AusAID ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදුන් දායකත්වය ඇගයීම පසුගියදා සිදු විය.

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු ලේකම් නිමල් වීරසේකර මහතා, ගරු භාණ්ඩාගාරික ඉස්මත් ඉසදීන් මහතා, හිටපු ගරු සභාපති මේජර් ෂර්ලි ද සිල්වා මහතා, විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය, නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.





ඉහළ ඡායාරූපය -
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු ලේකම් නිමල් වීරසේකර මහතා සහතික පත් බෙදා දුන් අවස්ථාව. නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. එම්. වී. පී. රාජපක්ෂ මහතා ද ඡායාරූපයේ වේ.

# ‘ස්ටැමිනා’
## ජාත්‍යන්තර සම්මානයට



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය විසින් බෙදා හරිනු ලබන කොන්ඩම් සන්නාමයක් වන ‘ස්ටැමිනා’ පසු ගිය දා ඉන්දියාවේ මුම්බායිහිදී පැවති ACEF සම්මාන ප්‍රදානයේදී ‘සන්නාම කළමනාකරණ විශිෂ්ටතා’ (Excellence in Brand Management) අංශයේ දෙවැනි ස්ථානය දිනා ගැනීමට සමත්විය. ආසියානු කලාපය තුළ පාරිභෝගික සන්නාම රැසක් මේ සඳහා ඉදිරිපත් කර තිබුණි.

ඡායාරූපය -
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සහකාර අධ්‍යක්ෂ (සන්නාම) අමිල ගුණසේකර මහතා (වමේ) **ACEF** සම්මානය **Neo@ Ogilvy** ශ්‍රී ලංකා ප්‍රධානි අමිත අමරසිංහ මහතා අතින් ලබා ගත් මොහොත.

# 2013 අලෙවිකරණ විශිෂ්ටයින්



2013 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිලධාරියා ලෙස සහකාර ප්‍රාදේශීය අලෙවි කලමනාකාර සමන් ඒකනායක මහතා, සමාජ අලෙවිකරණ තාක්ෂණික කමිටුවේ ගරු සභාපති චන්දිම ආර්. ගුණවර්ධන මහතා අතින් සම්මාන ලබමින්...



2013 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිලධාරියා තෙවන ස්ථානය සඳහා අලෙවි විධායක ලහිරු සමන් කුලසිංහ මහතා ගරු භාණ්ඩාගාරික ඉස්මත් ඉසදීන් මහතා අතින් සම්මාන ලබාගත් මොහොත...

2013 වසරේ විශිෂ්ටතම අලෙවිකරණ නිලධාරියා දෙවන ස්ථානය සඳහා සහකාර ප්‍රාදේශීය කළමනාකාර බී. ඒ. තුෂාර මහතාට සම්මානය හිමි විය.





# තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය ඉලක්ක




1. ***දිළිඳුකම තුරන් කිරීම.***
2. ***කුසගින්න තුරන් කිරීම.***
3. ***සෞඛ්‍යසම්පන්න බව හා යහජීවනය***
4. ***ගුණාත්මක අධ්‍යාපනයක්***
5. ***ස්ත්‍රී - පුරුෂ සමාජභාවී සමානාත්මතාව***
6. ***පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව***
7. ***දැරියහැකි හා පවිත්‍ර බලශක්තිය***
8. ***මනා කාර්යයන් හා ආර්ථික වර්ධනයන්***
9. ***කර්මාන්ත, නව හඳුන්වාදීම් හා මූලික පහසුකම්***
10. ***අසමානතා අවමකිරීම***
11. ***තිරසාර නගර හා ප්‍රජාවන්***
12. ***වගකිවයුතු භාවිතයන් හා නිෂ්පාදනය***
13. ***කාළගුණික තත්ව පිළිබඳ අවධානය***
14. ***මහ සයුරේ ජීවිත***
15. ***ගොඩබිම ජීවිත***
16. ***සාමය හා යුක්තිය වෙනුවෙන් ශක්තිමත් ආයතන***
17. ***සියලු අභිමතාර්ථ ජයගැනීමට අවශ්‍ය සහයෝගීතාව***

වසර 2016 ජනවාරි 01 වැනිදා සිට ඉදිරියට වසර 15ක් පුරා එනම් 2030 ඉලක්ක කරගනිමින් තිරසාර, සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධනයක් වෙනුවෙන් අභිමතාර්ථ 17ක් යටතේ රටවල් 193ක සහභාගීත්වයෙන් ‘තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 වැඩසටහන’ මේ වන විට සකස් කර තිබේ.

මේ යටතේ ඇති ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය හා සම්බන්ධ අභිමතාර්ථ ශ්‍රී ලංකාව තුළ සාර්ථක කරගැනීමට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය රජය සමග එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

මෙහිදී “විශේෂයෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය අවසන් කිරීම, සැම කෙනෙකුටම ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ආදී කරුණු පිළිබඳව මෙරට ජනතාව වෙනුවෙන් වැඩ කිරීම ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කාර්යයි.

ලොවපුරා බලපාන දුප්පත්කම අවසන් කිරීම. සෞභාග්‍ය උදාකිරීම, සැමට යහපත් වන තත්ත්වයක් ලබා දීම මෙන්ම පාරිසරික සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ කාලගුණික පරිවර්තන පිළිබඳ අවධානය යොමුකිරීම මෙම අභිමතාර්ථයන් සාර්ථක කර ගැනීමෙන් බලාපොරොත්තු වේ.





# “මිනිසාට සේවය කිරීමට මනුෂ්‍යත්වයෙන් කැපවෙමු”

## ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ
## ලෝක මානුෂවාදී දිනය සමරමින්





මිනිසාට සේවය කිරීමට මනුෂ්‍යත්වය හා සමානාත්මතාව හා අපක්ෂපාතීත්වය පෙරදැඩිව කටයුතු කිරීම අප සැමගේ යුතුකම හා වගකීම බව ලෝක මානුෂවාදී දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ද. පැවති සැමරුම් වැඩසටහනේ දී විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය පැවසුවාය. මනුෂ්‍යත්වය වෙනුවෙන් තම දිවි පූජා කළ සහ ඒ සඳහා කැප වූ සැමට ගෞරවයක් ලෙස විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වා වැඩසටහන අරඹන ලදි. අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය, වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය සහ ආපදා කමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ චතුර ලියනආරච්චි මහතා විසින් සභාව අමතන ලදි. හදිසි ආපදා අවස්ථාවක දී ගර්භනී මව්වරුන් ගේ සෞඛ්‍ය ආරක්ෂාව තරුණ කාන්තාවන් සහ ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ස්ප්‍රින්ට් (sprint) ව්‍යාපෘතිය මගින් මෙය සංවිධානය කරන ලදී. ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය සමග එක්ව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

# FPA සුවසේවා මධ්‍යස්ථානය කොග්ගල



කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පාර්ශ්වකරුවන් සහ කාර්මාන්තශාලා කළමනාකරණ කාර්යමණ්ඩල වෙනුවෙන් පැවති ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කාර්යයන් සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකදී නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා සභාව අමතන අවස්ථාව...





ඉහළ ඡායාරූපය : ජ්‍යෙෂ්ඨ කළමණාකාර නිශාන්ත හෙට්ටිආරච්චි මහතා උණවටුන සංචාරක පුරවරයේ කාන්තාවන් පිරිසක් දැනුවත් කරමින්.
පහළ ඡායාරූපය : උපදේශිකා ජේ. ඩී. භාග්‍යා මිය යුනිවෙලා ආයතනයේ සේවිකාවන් පිරිසකට උපදේශන වැඩසටහනක් මෙහෙයවමින්.